gender & mine action

# “තර්ක : බිම්බෝම්බ ඉවත්කරලීමේ ක්‍රියාදාමයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මූලප්‍රවාහ ගත කරවන්නේ ඇයි?”

## ► සාමාන්‍ය තර්කය :

✓ වෙනස් වූ විපත් වෙනස් වූ අවශ්‍යතා : කාන්තාවන් ගැහැණු ළමුන් පිරිමි ළමුන් හා පිරිමින් බිම්බෝම්බ නිසා වෙනස් වූ ආකාරයට විපතට පත්වන බැවින් වෙනස් වූ ආකාරයට උපකාර කළයුතු වේ. බිම්බෝම්බ වලින් විපතට පත් වීමේ ප්‍රවනතාවය, ප්‍රතිකාර ගැනීමට ඇති අවකාශය, දිගුකාලීන සංකලනය හා දැනුවත්වීම හා අවධානම පිලිබඳ අධ්‍යාපනය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මගින් බලපෑම් ඇති කරයි.

## ► ජාත්‍යන්තර පිළිගැනීම් :

බිම්බෝම්බ වැඩසටහන් වල සැලකිල්ලට ගතයුතු හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය ආකල්පයන් ක්‍රියාත්මක කිරීමට ඇති සුවිශේෂී වූ අවශ්‍යතාවයන් අවධාරනය කරන ජාත්‍යන්තර පිළිගැනීම් හා නියමු මාර්ග ඇත.

✓ කාන්තාව, සාමය සහ ආරක්‍ෂාව පිලිබඳ එක්සත් ජාතීන්ගේ යෝජනා 1325 (2000) විශේෂයෙන්ම අවධාරණය කර සිටින්නේ “ *කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ විශේෂිත වූ අවශ්‍යතා බිම්බෝම්බ ඉවත් කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී සැලකිල්ලට ගැනීම සියලු පාර්ශවකරුවන් විසින් සිදුකිරීමේ අවශ්‍යතාව”*

✓ 2005 දී එක්සත් ජාතීන්ගේ බිම්බෝම්බ ඉවත් කරලීමේ සේවය (UNMAS) බිම්බෝම්බ ඉවත්කරලීමේ වැඩසටහන් වලට ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය නියමු මාර්ග පළකරන ලදි.

✓ එක්සත් ජාතීන්ගේ අවිහරණ කටයුතු දෙපාර්තමේන්තුව (DDA) බිම්බෝම්බ වැඩසටහන් වල ස්ත්‍රීපුරුෂ සමාජභාවීමය ආකල්පයන් තිබීම සම්බන්ධ අවශ්‍යතාවය පිලිබඳ අවධානයට යොමු කිරීම හා

✓ 1995 ක්‍රියාත්මකවීම සඳහා බෙජිං වේදිකාවද 1998 කාන්තාවන්ගේ තත්වය සඳහාවූ කොමිසම ද බිම්බෝම්බ ගහන පෙදෙස්වල කාන්තාවන්ගේ විශේෂිත වූ අවධානයට ලක්විය යුතු කරුණු සම්බන්ධව අවධාරණය කරන ලදි.

## ► කාර්‍යශූරත්ව හා සමානාත්මතා තර්කය :

✓ **වෙනස්කොට නොසලකන බිම්බෝම්බ ඉවත්කරලීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවය ඇත** : බිම්බෝම්බ ඉවත් කිරීම හිස් අවකාශයක සිදු නොවේ. එය සිදුවන්නේ කාන්තාවන් හා පිරිමින් අතර පවරන ලද වගකීම් දැරීම බාර ගන්නා ලද ක්‍රියාකාරකම් වල සම්පත් පාලනය කිරීමට හා ඒවාට ළගාවීමට ඇති අවකාශ මෙන්ම තීරණ ගැනීමට ඇති අවස්ථා සම්බන්ධව වෙනස්කම් හා අසමානතා ඇත, ඒ හෙයින් බිම්බෝම්බ ව්‍යාපෘති කාන්තාවන්ට හා පිරිමින්ට එක හා සමානව නිරායාසයෙන් ඵලදායි නොවන අතර මෙම වැඩසටහන කාන්තාවන් හා පුරුෂයන් අතර පවතින අසමානතා පවත්වාගෙන යෑම හෝ වඩාත් තීව්‍ර කිරීම නොකළයුතුයි.

✓ **සමානාත්මතාවය කාර්‍යශූරත්වය මගපාදයි :** කාර්‍යශූර්‍ය හා පවත්නා බිම්බෝම්බ ව්‍යාපෘති වෙනස්කොට නොසලකන ක්‍රියාමාර්ග හා පුරුදු මත දැඩිව රඳා පවතී. සෑම කෙනෙකුටම මෙම බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිපත්ති, ක්‍රියාත්මක කිරීමට හා වැඩසටහන් මගින් සියලු දෙනාටම ඵල ලබා ගැනීමට සැලසුම් ක්‍රියාදාමයන් ආරම්භයේ

Campagne suisse contre les mines antipersonnel
3bis, chemin des Pontets, CH-1212 Grand-Lancy, Geneva, Switzerland.
Tel. +41 22 879 10 52 - Fax. +41 22 879 10 51
info@scbl-gender.ch www.scbl-gender.ch www.stopmines.ch

Swiss Campaign to Ban Landmines

සිටම ස්ත්‍රීපුරුෂ සමාජභාවීමය දැක්ම අන්තර්ගත විය යුතුයි. මෙයට බිම්බෝම්බ ඉවත් කරලීමේ වැඩසටහන් හා ක්‍රියාවලිය, සැලසුම් කිරීමේ, ක්‍රියාත්මක කරවීමේ, නිරීක්ෂණය කිරීමේ හා ඇගයීම යන සමස්ථ කාර්‍ය තුළම ප්‍රතිලාභික හා හවුල්කරු ප්‍රජාවේ ගැහැණු පිරිමින්ගේ සමාන දායකත්වය හා අදහස් ලබා ගැනීම මත පදනම් වේ. මෙයට වයස හා ලිංගය අනුව සියලු අදියරයන් තුළදීම දත්ත එක්රැස් කිරීම අවශ්‍ය වේ.

✓ **බිම්බෝම්බ ක්‍රියාවලියේ සාර්ථකත්වය වර්ධනය කිරීමට විවිධත්වය අනිවාර්ය වේ.** මිශ්‍ර කණ්ඩායම්, බෝම්බ ඉවත් කරන කණ්ඩායම් හෝ පීඩිත කණ්ඩායම් විය හැක. ඉලක්ක කණ්ඩායම් වල අවශ්‍යතා අවධාරණය කිරීම ඵලදායි වේ. විවිධ දැක්ම වල්, සිතුම් පැතුම් හා හැකියාවන් ඇති ජනතාව එක්කර ගැනීමෙන් බිම්බෝම්බ ක්‍රියාවලියේ විවිධත්වය වර්ධනය වේ.

▶ **ප්‍රමාණාත්මක තර්කය :**

✓ කාන්තාවන්ට සාපේක්ෂව පිරිමින් බිම්බෝම්බ ආශ්‍රිත අනතුරු වලට ගොදුරු වේ. (85-90% ක් බිම්බෝම්බ වලට ගොදුරුවන්නේ පිරිමින් හා පිරිමි ළමුන්) කෙසේ වෙතත් කාන්තාවන් වෙනත් උපද්‍රව වලට ගොදුරුවේ. විපතට පත්වූවන්ට ලැබෙන ආධාර වල ඇති අසමතුලිතභාවය හේතුකොට ගෙන කාන්තාවන්ට ලැබෙන්නේ අඩු පුනරුත්ථාපන උපකාරයි. මේ නිසා මියයන සංඛ්‍යාව පිරිමින්ට (29%) සාපේක්ෂව කාන්තාවන් ඉහළයි (43%)

▶ **සංවර්ධන තර්කය :**

✓ සංවර්ධනයෙහිලා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය පෙර කොන්දේසියකි. ඇක්ෂන් ඒඩ් (Action Aid) වචන වලින් කිවහොත් “ *කාන්තාවන්ගේ අයිතීන්, තේරීම හා අසන, එය ඉහළ දමන හා ආරක්ෂා කරන වැඩපිළිවෙලක් නොමැති නම් මොනම දුප්පත්කම දුරලීමේ ව්‍යාපාරයන්වත් සත්‍ය විය නොහැක*”[1]

✓ බිම්බෝම්බ ක්‍රියාවලිය යනු බිම්බෝම්බ ඉවත් කිරීමට පමණක් සීමා වූ හුදකලා වූ අංශයක් නොව ; එයද කාන්තාවන්ට පිරිමින්ට, ගැහැණු ළමුන්ට හා පිරිමි යන විපතටපත් සියල්ලටම පරිපූර්ණව ළගාවිය හැකි සංවර්ධනයේම කොටසකි.

✓ බිම්බෝම්බ ක්‍රියාවලිය ඉවත්කරන ලද ඉඩම් වර්ග මීටර් ප්‍රමාණය මතම ඉලක්ක කරගත් තත්වයෙන් ඔබ්බට ගොස් වර්ධනය වී කාන්තාවන්, ගැහැණු ළමුන්, පිරිමි ළමුන් සහ පිරිමින් ඉඩම් පරිහරණය කරන්නන් කවුද සහ පරිහරණය කරන ආකාරයද විශ්ලේෂණය කරයි. එම ක්‍රියාදාමයේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුකූලවන අතර හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය මූලප්‍රවාහ ගත කිරීම ස්වාභාවිකව ස්ථානගතවේ

**බිම්බෝම්බ ක්‍රියාවලියේ විවිධ අංශවලදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වැදගත් වන්නේ ඇයි?**

▶ **සමීක්ෂණ පැවැත්වීම :**

✓ දත්තවල නිවැරදිභාවයටද බිම්බෝම්බ වලින් අපවිත්‍රවීම සම්බන්ධව පූර්ණ අවබෝධයක් ලබාගෙන ඉවත්කිරීමේ ප්‍රමුඛතා හඳුනාගැනීම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය නැඹුරුවන සේ ක්‍රියාත්මකවීම අත්‍යවශ්‍ය වේ. කාන්තාවන් හා පිරිමින් තමන්ගේ පවරන ලද ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය භූමිකා හේතුකොට ගෙන බිම්බෝම්බ ගහන ප්‍රදේශ පිළිබඳ වෙනස් වූ තොරතුරු දරා සිටී. කාන්තා හා පිරිමි සමබර සමීක්ෂණ කණ්ඩායම් මගින් කාන්තාවන් හා පිරිමින්ගෙන් උපදේශන ලබා ගතහොත් පමණක් නිවැරදි හා පරිපූර්ණ තොරතුරු ලබාගත හැක. ඇතුළත්වූ ප්‍රවේශයන් භාවිතා කරන ලද අවස්ථා වල ප්‍රතිඵලය නිවැරදි සැලසුම් වූ බැවින් වඩාත් හොඳ ඉවත්කිරීමක් සිදුවිය.

---

[1] Action Aid “Women’s rights facts sheet” http://www.actionaid.org/assets/pdf/womensrightsfactsheet_a_w.pdf

**► ඉවත් කිරීම :**

✓ තම මුළු පවුලට ආර්ථික සුරක්ෂිතභාවයක් සැපයිය හැකි ආදායම් උත්පාදන රැකියා අවස්ථාවන් කාන්තාවන්ට හා පිරිමින්ට බිම්බෝම්බ ඉවත්කිරීම ගෙනදේ. බිම්බෝම්බ ඉවත්කිරීමේ රැකියා අවස්ථාවෙන් කාන්තාවන් වලක්වා තැබීමෙන් පවුලේ සුභසාධනයට බලපෑමක් ඇතිවීම නිසාවෙන් මුළු ප්‍රජාවටම බලපායි.

✓ බිම්බෝම්බ ඉවත් කරන කාන්තාවන් තම ප්‍රජාවේ එදිනෙදා ජීවත්වීම වර්ධනය කිරීමට සක්‍රියව දායකවනවා පමණක් නොව ප්‍රජාවේ අනෙක් කාන්තාවන්ට වෙතන ලාභී තත්වයන් භාර ගැනීමටද ග්‍රාමීය දේශපාලනය සමාජ මෙහෙවර හෝ අනිකුත් ක්‍රියාකාරීවීම්වලටද අනුක්‍රමණ කළ යුතු චරිතයක් ද වේ.

**► ඉඩම් වලට ප්‍රමුඛත්ව දීම:**

✓ පිරිමින්ගෙන් පමණක් බිම්බෝම්බ ඉවත් කළ යුතු ඉඩම් පිළිබඳ විමසූ විට කාන්තාවන් පමණක් විශේෂයෙන් පරිහරණය කරන ලද ඉඩම්, ජලය, හා දර ලබා ගැනීමට යන මං ප්‍රමුඛතා ක්‍රියාවලි වලින් ඉවත් වීමේ අවධානමක් ඇත.

**► ඉඩම් බෙදා දීම:**

✓ ඉඩම් හිමිකාරිත්වය කාන්තාවන්ට වෙනස් කොට සලකන සංදර්භ තුළ බිම්බෝම්බ ඉවත් කරන ලද ඉඩම් වලට ප්‍රවේශය කාට ඇත්ද යන්න ගණන් නොගන්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සංවේදී නොවන ඉඩම් බෙදා දීමකින් ඉඩම් පරිහරණය කාන්තාවන් අහිමිවීමේ අවධානමක් ඇත.

**► බිම්බෝම්බ පිළිබඳ අධ්‍යාපනයට ඇති ප්‍රවේශය: (MRE)**

✓ කාන්තාවන්ට ගෘහය තුළ ඇති වැඩපළ ළමයි බලා ගැනීම කාන්තා පිරිමි වෙන්වූ රැස්වීම් නොවූ විට එහා මෙහා යෑමේ සීමා, ඔවුන්ගේ අයිතිය පිළිබඳ අල්ප දැනුම රූපවාහිනි/ ගුවන්විදුලි නොමැතිකම හා සාක්ෂරතාවය අඩුවීම හේතු කොට ගෙන හොද අවබෝධයක් හා බිම්බෝම්බ පිළිබඳ අධ්‍යාපන අවස්ථා අවම වීමට පුළුවන.

**► බිම්බෝම්බ පිළිබඳ අධ්‍යාපනයේ අන්තර්ගතය:**

✓ බිම්බෝම්බ සම්බන්ධව කාන්තාවන්ට හා පිරිමින්ට වෙනස් වූ අවධානම් හැසිරීම් හා අත්දැකීම් අවස්ථා ඇත. මේ නිසාම කාන්තාවන්ගේ හා පිරිමින්ගේ බිම්බෝම්බ පිළිබඳ අත්දැකීම් සම්බන්ධව හරියාකාර ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය විශ්ලේෂණයන් මත පදනම් වූ එම විශේෂිත වූ අවධානම් වලට සරිලන සේ සැකසූ බිම්බෝම්බ පිළිබඳ අධ්‍යාපන කරුණු සැලකිය යුතුයි.

**► බිම්බෝම්බ වලින් බේරුන හා විපතට පත්වූ අය.**

✓ බිම්බෝම්බ නිසා සෘජුව විපතට පත්වූවන්ගෙන් (තුවාලවූ සහ මියගිය) 85-90% ක්ම පිරිමින්ය. මතක තබා ගතයුතු වැදගත් දෙයක් වන්නේ මෙම තුවාලවූ පිරිමින්ගෙන් බහුතරයක් කාන්තාව සමග ජීවත් වනවා හෝ සම්බන්ධ අයයි. (බිරිද, සොහොයුරු, දුව, මව අනෙක් පවුලේ අය, මිතුරන් හා අසල්වැසියන් ) ඔවුන් මෙම සෘජු විපතට පත්වූවන් රැක බලාගනී. මෙම තත්වය කාන්තාවන්ට වඩාත් අවධානයට ලක් කරන ප්‍රබල විපාක සුළු තත්වයකි.[2]

---

[2] තුවාලලත් පවුලේ සාමාජිකයින් බලාගන්නා ස්ත්‍රීන් හා ගැහැණු ළමයින්ට අධ්‍යාපනයක් ලැබීමට හෝ වැටුප් ලබන රැකියාවක නියැලීමට බාධා ඇති වෙනවා. සාම්ප්‍රදායික පීතෘමූලික සමාජයන් තුළ අපකීර්තියට පත් කිරීම, වෙන් කිරීම, කාන්තා අසරණභාවය වැනි වෙනස්කම් කාන්තා චරිතය බොහෝ විට ලක් විය හැකිය. ඔවුන්ගේ අඹුවන් ජීවත්වීම සඳහා පිහිට පැතීමේදී පිරිමින් අසහනයෙන් කලහකාරිත්වයටත්, කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වයටත් යොමු වෙනවා. ස්වාමිපුරුෂයින් වැටුපක් නොලබන සමාජයන් තුළ සිටින ස්ත්‍රිය බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් අන්ත දිළිදු තත්වයේ රැකියාවලට සහ/හෝ ගණිකා වෘත්තීන්වලට යොමු වෙනවා

✓ බිම්බෝම්බ වලින් “විපතට පත් වුවන්” ලෙස අර්ථ දක්වන අයට විශේෂයෙන් කාන්තාවන් බිම්බෝම්බ වලින් බේරුණු අය (විශේෂයෙන් පිරිමි) හට උපකාරි වෙමින් ඔවුන්ගෙන් යැපෙමින් ඔවුන් සමග ජීවත් වේ.

## ► විපතටපත් වුවන්ට ලැබෙන ආධාර වලට ප්‍රවේශය

✓ සම්පත් සීමිත හා ඒවා පිරිමි විසින් පාලනය කරන සමාජවල කාන්තාවන්ට වෛද්‍ය ප්‍රතිකාර හා කෘතිම අත්, පා ලැබීම සිදුනොවන්නට පුළුවන. ප්‍රත්‍යක්ෂ ඵලවලට කාන්තාවන් හා ගැහැණු ළමයි වෙනුවෙන් විස්තීරණ ප්‍රතිසංවිධාන වැඩසටහන් වලට වැය වන කාලය හා ධනය අමතර බරක් පටවයි.[3]

✓ කාන්තාවන් පවුලේ ප්‍රධාන උපයන්නා ලෙස සාමාන්‍යයෙන් ගණන් නොගන්නා බැවින් ආදායම් උත්පාදන ක්‍රියාවලියේදි ඔවුනට වෙනස් කොට සලකයි. නමුත් පිරිමියා බිම්බෝම්බෙන් තුවාල වී සිටින අවස්ථාවේදි කාන්තාව පවුලේ ප්‍රධාන උපයන්නා බවට පත්වන බැවින් එම පවුලේ ආර්ථිකය පවත්වා ගෙන යෑමට ඔවුනට ප්‍රමුඛතාවය දිය යුතුයි.

✓ සමහර සංස්කෘතීන් වල කාන්තාවන් ප්‍රමාණවත් වෛද්‍ය ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ලබා ගැනීමට නොහැකිවන්නේ සම්ප්‍රදායන් හා ආකල්ප, කාන්තාවක් විසින්ම ප්‍රතිකාර කළයුතු යැයි සලකන හෙයින් හා සමහර පළාත්වල කාන්තා වෛද්‍යවරියන් ඉතා අල්පයක් හෝ නොමැතිවීම නිසාම කාන්තාවන් තමන්ට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නොලබති.

## ► පුනරුත්ථාපනය / ප්‍රතිසංකලනය

✓ විපතට පත් රටවල පිරිමි නෑදෑයෙක් හෝ ස්වාමිපුරුෂයා වියෝවීම නිසා කාන්තාවන් බරපතල ආර්ථික බලපෑමකට ලක්වේ. සමහරවිට කාන්තාවන්ට සාධාරණ වැටුපක් හෝ ආරක්ෂාවක් ඇති රැකියාවට ප්‍රවේශයක් නොමැතිවීම හෝ සියලුම හෝ සමහර රැකියාවන් ඇයට කළ නොහැකි සමාජයක් ඇති රටක පවුලේ එකම උපයන්නා බවට හදිසියේ පත්වීමට පුළුවන.

✓ සමාජීය විපාක ගැන සිතන විට, තුවාල වූ පසු කාන්තාවන්ට හා පිරිමින්ට වෙනස් වූ ආකාරයට සලකනු ලබයි. සාමාන්‍යයෙන් තුවාල වූ පිරිමින්ට තම පවුල් මගින් සහාය දක්වන අතර (පවුලේ කාන්තාවන්ද) විවාහක කාන්තාවන්ට වඩා අවධානමක් එනම් දික්කසාදයද, අවිවාහක කාන්තාවන්ට විවාහවීමේ අවස්ථාවද අහිමිවේ. තුවාල වූ කාන්තාවන්, අතහැර දැමීම, සමාජ ගැරහිලි වලට ගොදුරුවීම, හුදකලාවීම හා ආර්ථික අවස්ථා නොමැතිවීම නිසා අන්ත දුගී තත්වයට පත්වේ.[4]

✓ කාන්තාවන් හා පිරිමින් පුනරුත්ථාපනයේදී එකිනෙකාට වෙනස් වූ ආකාරයක් දක්වයි. මේ නිසා කාටද ප්‍රතිකාර කරන්නේ යන්න මත වෛද්‍ය ප්‍රතිචාර සකස් විය යුතුයි. උදාහරණයක් වශයෙන් සමහර අධ්‍යයන පෙන්වා දෙන ආකාරයට පිරිමින් කාන්තාවන්ට වඩා වැඩි කලක් තුවාල වූ පසු පුනරුත්තාපනය වීමට ගන්නා අතර ආබාධයක් සහිතව ජීවත්වීමට සිදුවීමට මුහුණදීමට කාන්තාවන්ට වඩා වැඩි අපහසුතාවයක් ද දක්වයි

---

[3] ICRC, Landmines and explosive remnants of war, in Women and War, Feb. 2008, p.16

[4] සංවර්ධනය වෙමින් පවතින රටවල ආබාධිත කාන්තාවන්ගේ විරැකියාව 100% (WILPF, කාන්තාව හා පොකුරු බෝම්බ)